


## අවබෝධයක් නැති අවබෝධතා ගිවිසුමක් ...?

**පසුගිය** සති කිහිපය තුළ ලංකාවේ සිදුවූ සිද්ධීන් දෙස බලන්න වෙන්නේ එක ඇහැක් වහගෙන, අනෙක් ඇහැ ඇරගෙන. ඒ කියන්නෙ එක ඇසකින් අඬන ගමන් අනෙකෙන් ඊට පස්සෙ සිදුවෙන්නෙ මොනවද කියලා දුකෙන් විමතියෙන් දෙකෙන්ම බලන් ඉන්න සිද්ධ වෙනවා. අපේ හමුදාවේ ලොක්කා කොච්චර වීරෝදාර වුණත් සමහර වෙලාවට මහ ගොන් වැඩත් කරනවා. අපේ අහිංසක අසරණ කොල්ලො මාස ගණන් මහන්සි වෙලා ගොඩනගා ගත්ත රණ බලය නැවතත් දවස් දෙක තුනකින්ම කොටින් අතට පත්කලා. හමුදාවේ ලොක්කන්ට හරියටම සිද්ධ වුණේ මොකක්ද කියලා තවමත් උත්තරයක් දෙන්න බැරි වෙලා. කිසිම සැලැස්මක් නැතිව ගිහිල්ල කොටින්ට අපේ කොල්ලො ටික මුහමලේදී 200, 300 ක් බිලිදුන්නේ මොන ප්ලෑන් එකක් ගහලද අහන්න වෙන්නෙත් ඔවුන්ගෙන්ම තමයි. ඊළඟට සීගිරියේ දී සිද්ධ වෙච්ච දේත් එක්කම අපේ ප්‍රතිඵල හුඟක් වතුරෙ ගියා. දැන් ඉතින් අපේ දේශපාලන ලොක්කො ටික එදා භුක්ති වින්ද සතුට කඳුළු වෙලා දොරේ ගලනවා ඇති. කොටින් කරන බොහෝ දේවල් අපිට නවත්තගන්න බැරිවුණත් සෑහෙනදුරට වළක්වා ගන්න පුළුවන්. අඩුගානේ එදා සීගිරියේ හමුදා බස් රථගාලේ දොරටුව ළඟට ලී කොටයක්වත් දාලා තිබුණ නම් සිද්ධ වෙච්ච විනාශය මීට වඩා අවම කර ගන්න තිබ්බා. දැන් ඒ සියලුම දේවල් සිද්ධ වෙලා ඉවරයි. කොච්චර ලීවත් කතා කලත්, ඇරපු ඇහැත් වහගෙනම තමයි අඬන්න වෙන්නෙ.

දැන් සාම සිනමා පටියේ ඊළඟ ජවනිකාවත් පටන් අරන් දෙපැත්තම ජිනිවා ගියා කතා කරන්න. කොටින්ටත් දැන් ආවාට ගියාට සාම සාකච්ඡා අත හරින්න බැහැ. සාමෙ ඕන්නැති වුණත් ඔවුන්ට අකමැත්තෙන් හරි මේසෙ වාඩිවෙන්න සිද්ධ වෙනවා. ඔය සාම මේසෙන් මේ වෙනකම්නම් කොටින්ගෙන් යහපත් ප්‍රතිචාරයක් ලැබිල නැහැ. ඔවුන් මාතෘකාව පටන් ගන්නෙම වැරදි තැනින්. දෙගොල්ලොම එකට කෑම කාල, තේ බීලා හෝටෙල්වල නිදාගෙන අනෙක් දවසේ උදේ මේසෙ වාඩිවෙලා එකිනෙකාට චෝදනා කර ගන්නවා. තවත් ඉස්සරහට සිද්ද වෙන දේවල් ගැන දැන්මම කතා කරන්න බැහැ. ඒකට කාලයට ඉඩදෙමු.

> *අනෙක මොන ගිවිසුම අත්සන් කලත් මේ දෙපැත්තම ඉන්නෙ බොහෝ ආත්මාර්ථකාමී පිරිස්. ඔවුන් මඟුල් ගෙවල්වල, මල ගෙවල්වල, ඩිනර් ඩාන්ස්වල මොන කොන්දේසියක්වත් නැතිව එකට එකතු වුණත් රට වෙනුවෙන් නම් එකතු කර ගන්න හුඟක් අමාරුයි.*

මේ ඔක්කොටම වඩා ලංකාවේ සිද්ද වෙච්ච විශේෂ දෙයක් තියෙනවා. ඒ දිහා නම් කවුරුත් ඇස් දෙකම ඇරල හොඳින් බලන්න ඕනෙ. ඒ ශ්‍රීලනිපය හා යූ.ඇන්.පී. ය අත්සන් කරපු අවබෝධතා ගිවිසුම. ගිවිසුම ''අවබෝධතා'' වුණාට දෙපැත්තෙම බොහෝ අය කියන්නෙ ඒ ගැන අවබෝධයක් නැහැ කියලා. අත්සන් කරපු දවසෙ ආණ්ඩුවේ මාධ්‍යවලින් මේක ඓතිහාසික සිද්ධියක් බවට හුගාක් ''බයිලා'' ගැහුවා. අපේ රටේ අත්සන් කරපු බොහෝ ඓතිහාසික දේවල් එකතු වුණේ ඉතිහාස කුණු කූඩ වලට. අත්සන් කරපු ගමන් කිසි දෙයක් ඓතිහාසික වෙන්නෙ නැහැ. එහෙම වෙන්නෙ ඒකෙ සාර්ථක අසාර්ථක භාවය අනුවයි. දෙගොල්ලොම මේ ගිවිසුම අත්සන් කළේ රට ගැන හිතලා අවංකවම නම් අනිවාර්යයෙන්ම මේක සාර්ථක වෙන්න ඕනෙ. එහෙම වෙන පාටක් තවම නම් නැහැ. සමහරු ඇමැතිකම්වලට පොරකනවා. යූ.ඇන්.පී. සමහරු 40% ක බලයක් රජයෙන් ඉල්ලනවා. දෙපැත්තෙ සමහරු කඹ අදිනවා. හැබැයි අපේ රටේ ප්‍රධාන පක්ෂ දෙකම එකතු වෙලා මේ ප්‍රශ්නෙට විසඳුමක් ගෙනාවොත් මේකෙන් වැඩියෙන්ම පරාජයට පත්වෙන්නෙ ප්‍රභාකරන්. මොකද රටේ ජනගහනයෙන් 90% ක් පමණ මේ පක්ෂ දෙක නියෝජනය කරනවා. එතකොට ප්‍රභාකරන්ට 'අවිශ්වාසයි' කියල විසඳුම මඟ හරින්න බැහැ. ප්‍රභාකරන් එම විසඳුමට හිස නමන්නේ නැතිවුණත් ලෝකයට සිද්ධවෙනව ප්‍රභාගේ හිස නවලා දාන්න.

මේ පක්ෂ දෙක එකතු වුණොත් ජේ.වී.පී.ය ප්‍රධාන විපක්ෂය බවට පත්වෙන බවත් එය වළක්වන්න යූ.එන්.පී.යේ කොටසක් විපක්ෂය ලෙස පාර්ලිමේන්තුවේ ඉදිවී යන්න, ජයදේව උයන්ගොඩ මහත්මයා ලක්බිමට ප්‍රකාශ කරලා තිබුණා. මම නම් හිතන්නෙ නැහැ ඒක එහෙම සිද්ද වේවි කියලා. ගිවිසුමක් අත්සන් කලාට දොගොල්ලො එකතු වෙලා නැහැ. අනෙක අත්සන් කලෙත් අවුරුදු දෙකකට පමණයි. අනෙක ප්‍රධාන විපක්ෂය වෙන්න ජේ.වී.පී.යට තව බොහෝ දුර ගමනක් යන්න තියෙනවා.

අනෙක මොන ගිවිසුම අත්සන් කලත් මේ දෙපැත්තම ඉන්නෙ බොහෝ ආත්මාර්ථකාමී පිරිස්. ඔවුන් මඟුල් ගෙවල්වල, මල ගෙවල්වල, ඩිනර් ඩාන්ස්වල මොන කොන්දේසියක්වත් නැතිව එකට එකතු වුණත් රට වෙනුවෙන් නම් එකතු කර ගන්න හුඟක් අමාරුයි. මේ ප්‍රශ්න මෙච්චර දුරදිග යන්නෙ ඒකයි. අනෙක රනිල්ටත් දැන් නායකත්වය රැක ගැනීමේ ප්‍රශ්න මතුවෙලා. ඒකෙන් බේරෙන්න නම් එයාටත් මොනවා හරි කරන්න වෙනවා. ඉස්සරහට මහින්දටත් එහෙමයි. ප්‍රභාකරන්ටත් සිද්ද වෙලා තියෙන්නෙ ඒ දේම තමයි. ඒ නිසා මේ තුන්දෙනාටම රට ගැන හිතල හෝ නොහිතල මොනවා හරි කරන්න සිද්ද වෙනවා. ඒ නිසා මේකෙ අවංකකම ගැන තවම මොකුත් කියන්න බැරි ඒකයි. ඒකත් හරියට පොලී මුදලාලිලා සල්ලි පොලියට දෙනව වගේ වැඩක්. පොලී මුදලාලිලා ණය මුදල එකපාර ගෙවල දානවට කැමැති නැහැ. ඒ පොලිය නැතිවෙන නිසා. මේකටත් ඒ දේම සිද්ද වුණොත් රටට දෙයියන්ගෙම පිහිට තමයි. මේ සියලු දේවල්වලට ජාතක කතා සංග්‍රහයේ එන ජවක ජාතකයෙන් අපිට වැදගත් පණිවිඩයක් ලබා දෙනවා. ඒ කවර යහපත් කටයුත්තක් වුව සුදුසු පරිදි කල යුතුයි. ලාභ වාසි අපේක්ෂාවෙන් නුසුදුසු පරිදි ඒවා නොකල යුතුයි.'' යන කාරණයයි.






## කුසුම්සිරි සහ යශෝධරා සරච්චන්ද්‍ර

ප්‍රථමව කලාකාමී සොඳුරු ඔබගෙන් අපට අවසර !

මෙල්බර්න් පුරයට නව්‍ය වූ අප දෙදෙන වසර ගණනක් මුළුල්ලේ හැදෑරූ, අත්විඳි, නිර්මාණකරණයේ නියැළුණු නොයෙක්වූ කලාවන් ගේ රසවත් වූත්, සුන්දර වූත්, කටුක වූත් පැතිකඩ මෙතැන් සිට ඉදිරියට ඔබ සමග කතාබස් කිරීම උදෙසා මේ පුවත්පත් පිට කරළියක් කොට ගනිමු.

අපගේ මෙම කරළිය වූ කලී ලාංකික ලෙයින් පෝෂිත නර්තන, සංගීත, නාට්‍ය, වාදන ආදී අපේ කලා කෙතෙහි වැඩෙන්නා වූ කරළියක් වන්නේය.

මහාචාර්‍ය- සරච්චන්ද්‍රයන් ගේ දියණිය වීමේ භාග්‍යයෙන් උපතේ සිට ලැබූ එම පින්වත් ඇසුර ඔස්සේ ලැබුවා වූ අනේකවිධ අත්දැකීම් තුළින් මේ කරළිය පෝෂණය වනු ඇත.

යම් යම් කලාංග, ඒවායේ ගුණාංග, ඉතිහාසය ආදිය කතාබස් කරන්නා සේම ඒ ඒ කලාංග සාමාන්‍ය මිනිසුන් වන ඔබට - අපට වත්මන් කලා රාමුවෙහි සමීප වන්නා වූ අයුරු සාකච්ඡා කරලීමට අප වග බලා ගන්නෙමු.

කවුරුන් කෙසේ කුමක් කීවත් ලොව ඉදිරියෙහි සාඩම්බර ලෙසත්, ප්‍රෞඪ ලෙසත් විදහාලිය හැකි කලා කෙතක් ශ්‍රී ලාංකික අප සතුය.

ඉදින් ඒ කලා කෙතේ ඵලයන් සමග මේ කරළිය තුළින් ඉදිරියේදී අපි ඔබ බැහැ දකිමු.

කුසුම්සිරි සහ යශෝධරා සරච්චන්ද්‍ර

Minimize your Vehicle Maintenances.......
with our Superior Vehicle Protection Services

**Our Vehicle Protection Services Include:**

- CRYSTAL GLAZE PAINT PROTECTION
- INTERIOR PROTECTION
- INSTALL RUST CONTROL UNITS
- WINDOW TINTING

We Provide Quality, Reliable and Affordable Vehicle ProtectionServices

Contact : 0412 037 615
**JI Automotive Services**
5/63 Lonsdale Street Dandenong VIC 3175
Telephone : 03 9755 5974

**U.D. Electricals**
ඔබේ සියළුම ගෘහ විදුලි අවශ්‍යතා සඳහා
බලයලත් විදුලි ශිල්පි
Registered Electrical Contractors and Licenced Electrician (Rec 17240)
Down lights, Power points,
Sensor lights, Exhaust fans,
Heter lights, Safty switches,
Upgradig fuse boards
All Electrical Work
Call **Upali** 0422 052 425/ 03 97056697
Narre Warren
**Reasonabe Rates + All Work Gurenteed**